## සමාජ සංවර්ධන පදනම පිළිබඳ ව්‍යවස්ථාව.

**හැඳින්වීම**

දුප්පත්කම අවම වූ සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමේ අරමුණින් සමාජයේ අවාසි සහගත තත්වයට පත් කාන්තාවන්, ළමයින්, තරුණ තරුණියන්, වැඩිහිටියන් ආදී සමාජ ස්ථරයන්ට අයත් කොටස්වල සමාජ අභිවෘද්ධිය හා ආර්ථික වර්ධනය ඉලක්ක කර ගනිමින් 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි පනත යටතේ සමෘද්ධි අධිකාරිය පිහිටුවා ඇත. අප රට නිදහසින් පසු මේ දක්වා මුහුණ දෙන ප්‍රධානම ගැටළුවලින් එකක් වන දුප්පත්කම දුරු කිරීම සඳහා රජය ක්‍රියාත්මක කර වන ජාතික වැඩසටහන සමෘද්ධි ව්‍යාපාරයයි. මේ යටතේ අඩු ආදායම්ලාභීන් ලෙස එවකට හඳුනා ගන්නා ලද පවුල් ලක්ෂ 19 ක් සමෘද්ධි ව්‍යාපාරය සමග ඍජුවම සම්බන්ධ වනු ඇත. මෙම පවුල් සමෘද්ධිමත් පවුල්බවට පත් කිරීම සඳහා ජීවනෝපාය සංවර්ධනය, ආධ්‍යාත්මික සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය යන ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශයන් හරහා සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක වෙමින් පවති.

මෙහි සඳහන් ජීවනෝපාය සංවර්ධන හා යටිතල පහසුකම් සංවර්ධනයට වඩා ආධ්‍යාත්මික සංවර්ධනය යන සුවිශේෂි කාර්යභාරයකි. මෙය කිසියම් පිරිසකට රැකියාවකට හෝ පැය 08 ක කාලය රාජකාරියක් ලෙස පැවරීමෙන් සාර්ථක කර ගැනීම අසීරුය. එය අතිශයින්ම මානුෂික හා ආධ්‍යාත්මික බැඳීමකින් යුතුව සිදු විය යුතු ක්‍රියාදාමයකි. එබැවින් මෙම සුවිශේෂි වූ කාර්ය භාරය ඉටු කිරීම සඳහා දැනටමත් ප්‍රාදේශීය මට්ටමින් සමාජ සංවර්ධන පදනම නමින් සංවිධානයක් පිහිටුවා විශාල වැඩ කොටසක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර මෙහි සමස්ත ප්‍රතිඵල නෙලා ගැනීම සඳහා දිස්ත්‍රික් සමාජ සංවර්ධන පදනම හා ජාතික තලය නියෝජනය කරමින් ජාතික සමාජ සංවර්ධන පදනම පිහිටුවීමේ අවශ්‍යතාවය ඇති අතර 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනතේ 15 වන වගන්තිය විධිවිධානවලට අනුව මෙම අරමුදල පිහිටු වනු ඇත.

01. නාමය :- ........................................................ සමාජ සංවර්ධන පදනම
(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ / සමෘද්ධි මහා සංගමයේ නම මුලට යෙදිය යුතුය)

02. බල ප්‍රදේශය :- ...................................................... දිස්ත්‍රික්කයේ / බල ප්‍රදේශය

03. ලිපිනය :- ........................................................................................
(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ / සමෘද්ධි මහා සංගමයේ ලිපිනය)

**ප්‍රතිපත්ති :-**

01. විවිධ හේතු නිසා අසරණභාවයට පත්ව සිටින විශේෂ සමාජ කොටස්වලට අයිති පුද්ගලයින්ටද අනෙකුත් සාමාන්‍ය පුරවැසියන් සේ ජීවත්වීමට අවස්ථාවක් තිබිය යුතු බවට පිළිගැනීම.

02. එකිනෙකාට සහයවීම සමස්ථ සමාජ ප්‍රජාවගේම වගකීම හා යුතුකම බව පිළිගනිමින් සාරධර්ම පිරි සමෘද්ධිමත් සමාජයක් ගොඩ නැගීම.

**අරමුණු :-**

1. පාසැල් යන වයසේ සිටින එහෙත් ආර්ථික හා සමාජීය ගැටළු මත පාසැල් නොයන ළමුන් පාසැල් යැවීමට අවශ්‍ය ආකල්පමය වෙනසක් ඇති කිරීම හා අවශ්‍ය අවස්ථාවල ආර්ථිකමය ආධාර සැපයීම.
2. සමාජයේ විවිධ අවාසිසහගත තත්වය හමුවේ අසරණභාවය හේතුවෙන් නිවාස අහිමි පවුල් සඳහා නිවාස ඉදිකිරීම.
3. අන්ත දුප්පත් මට්ටමේ සිටින කිසිසේත්ම ආර්ථික වශයෙන් සවිබල ගැන්විය නොහැකි සමාජය විසින් රැක බලා ගත යුතු පවුල් හඳුනා ගෙන ඔවුන්ට සහය සැපයීම.
4. සමාජයේ විවිධ අවාසි සහගත තත්ත්වයන් හමුවේ අඩු ආදායම්ලාභීන් මුහුණ දෙන ඕනෑම ගැටළුකාරි තත්වයකදී ඔවුන්ට අවශ්‍ය ආධාර උපකාර ලබාදීම.
5. මධ්‍යසාර දුම්වැටි හා නීති විරෝධි මත් ද්‍රව්‍ය නිසා සිදුවී ඇති සමාජ හානිය අවම කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම.
6. ළමුන්, කාන්තාවන් හා වැඩිහිටියන්ගේ සමාජීය අයිතිය සුරක්ෂිත කරමින් ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම.
7. ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම් තුලින් ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම.
8. ගොඩනගන සමාජ සංවර්ධන පදනමේ අරමුදල ඉතාමත් ඵලදායීව හා විනි විද භාවයෙන් යුතුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
9. කාලානුරූපීව / අවස්ථාවෝචිතව සමෘද්ධි අධිකාරියේ සමාජ සංවර්ධන අංශය මගින් මෙහෙය වනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
10. සැම සුවදායක ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කිරීම.

**සංයුතිය**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පදනම් කොට ගෙන පිහිටුවනු ලබන සමාජ සංවර්ධන පදනම පහත සඳහන් අයුරින් සමන්විත වනු ඇත.

1. ප්‍රාදේශීය ලේකම් ( සභාපති)
2. සමාජ සංවර්ධන සහකාර ( ලේකම්)
3. කළමණාකාර අධ්‍යක්ෂ / මුලස්ථාන කළමණාකරු ( භාණ්ඩාගාරික)
4. සියළු කළාප කළමණාකරු
5. ව්‍යාපෘති කළමණාකරු
6. පාලක මණ්ඩල සභාපති / විධායක කමිටු සභාපති.
7. සුරාබදු පරීක්ෂක

8. වනිතා සංවර්ධන නිලධාරි
9. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ
10. බෞද්ධ කටයුතු සමායෝජක
11. එක් ග්‍රාම නිලධාරිවරයෙක්
12. එක් සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයෙක්

    මීට අමතරව පහත සඳහන් ආයතනයන්හි එක් නිලධාරියෙකු බැගින් උපදේශක මණ්ඩලය සඳහා යොදවා ගැනීමට කටයුතු කරන්න. අවශ්‍යතාවය පරිදි වෙනත් ආයතනද සහභාගී කරවා ගත හැකිය.

**උපදේශක මණ්ඩලය**

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමකට ලක් වූ පුද්ගලයන්ගෙන්, රාජ්‍ය නිලධාරින්ගෙන් සමන්විත මණ්ඩලයක් මගින් අරමුදල් සැපයීම, විවිධ ආධාර උපකාර ලබාදීම, උපදෙස් හා මග පෙන්වීම් ලබා ගැනීම සඳහා තෝරා පත් කර ගත යුතුව ඇත.

**අරමුදල් රැස් කිරීම හා ගිණුම් තැබීම.**

- ජාත්‍යන්තර දුම්වැටි විරෝධී කොඩි දිනයට සමගාමීව පවත්වනු ලබන සමෘද්ධි කොඩි අලෙවියෙන් ලබන ආදායම. ( ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්)
- මත් නිවාරණය කොඩි සතිය වෙනුවෙන් කොඩි, කැට, ලේබල්, පෝස්ටර් සහ ස්ටිකර් ප්‍රධාන කාර්යාලයෙන් ලබාදෙන අතර ඒ සඳහා වන මුද්‍රණ වියදම වෙනුවෙන් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් රු. 5,000/- ක් බැගින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදිය යුතුය. එම මුදලෙන් 50% ක් දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රධාන කාර්යාලයට ලබාදිය යුතුය.
- දේශීය දානපතීන්ගෙන් ලබා ගන්නා මුදල් ආධාර ලබා ගැනීම.
- වෙනත් නිර්මාණශීලි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් පදනමේ ආදායම වැඩි කර ගැනීම.

**අරමුදල් භාවිතය**

- සමෘද්ධි සමාජ සංවර්ධන පදනමේ සියළු මුදල් සමාජ සංවර්ධන අරමුදල ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය නමින් සමෘද්ධි බැංකුවේ සාමාජික නොවන ගිණුමක තැන්පත් කළ යුතුය.
- මුදල් පරිහරණය කිරීමේදී සභාපති හා භාණ්ඩාගාරික යන දෙදෙනාගේ අත්සන සියළු චෙක්පත් ගණුදෙනු සහ ගිණුම් කටයුතුවලට යෙදවිය යුතුය.

- පදනමේ මුදල් වියදම් කිරීමේදී ජාතික පදනම සාමාජික සංඛ්‍යාවෙන් ½ කට වැඩි පිරිසකගේ කැමැත්ත මත සිදු කළ යුතුය.
- සියළුම මුදල් වියදම් මු.රෙ. 135 ට අනුව බලය පැවරීම කළයුතු වේ.
- අරමුදලේ මුදල් ආදායම් හා වියදම් පිළිබඳව සංක්ෂිප්ත වාර්තාවක් මාස 06 කට වරක් සමාජ සංවර්ධන අංශයට පිටපතක් සහිතව අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය නමට එවිය යුතුය.

- සෑම වසරක් තුළම එම වර්ෂයේ ආදායමින් අවම වහයෙන් 80% ක් එම වර්ෂය තුලම වියදම් කළ යුතුය. (අරමුණ හා පරමාර්ථවලට අනුකූලව)
- අරමුදලේ ආදායම් වියදම් පිළිබඳ විස්තරයක් සෑම මසකම අදාළ සමාජ සංවර්ධන පදනමේ රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.
- මෙම මුදල් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ජේදයේ 5 වැනි උප ජේදයේ නියමයන්ටද පොදු දේපල පනතේ ( 1982 අංක 12) විස්තරය කරනු ලබන විෂයන්ටද අදාළ වේ.

**වගකීම**

**සභාපති:-**

- ❖ සියළු සාමාජිකයින් කැඳවීමේ හා රැස්වීමේ මුලසුන දැරීම.
- ❖ මුදල් පරිහරණයේදී අරමුණු, පරමාර්ථ වලට පමණක් මුදල් යෙදවීම.
- ❖ ගිණුමේ මුදල් භාවිතා කිරීම සඳහා චෙක්පත්වලට අත්සන් තැබීම.

**ලේකම්**

- ❖ සියළු වාර්තා හා ලේඛණ සකස් කර අදාළ තොරතුරු සාමාජිකයින්ට වාර්තා කිරීම.
- ❖ ගිණුමේ මුදල් ආපසු ගැනීම සඳහා අත්සන් තැබීම.
- ❖ සමාජ සංවර්ධන පදනමේ සියළු තීන්දු, තීරණ සටහන් තබා ගැනීම.

**භාණ්ඩාගාරික**

- ❖ සමාජ සංවර්ධන පදනමේ ගිණුම් හා ගණුදෙනු ක්‍රමවත්ව පවත්වා ගෙන යාම හා ගිණුම් සටහන් තබා ගැනීම.
- ❖ ලැබෙන මුදල් නිසි පරිදි බැංකු ගත කිරීම.
- ❖ අරමුදල් වියදම් කිරීමේදී චෙක්පත්වලට අත්සන් කිරීම.
- ❖ මසකට වරක් ගිණුම් වාර්තාව සකස් කිරීම හා සමාජ සංවර්ධන පදනමේ රැස්වීමට ඉදිරිපත් කිරීම.
- ❖ එම මාසික ගිණුම් වාර්තා සමෘද්ධි අධිකාරියට ඉදිරිපත් කිරීම.

**රැස්වීම**

(සමාජ සංවර්ධන පදනම අවම වශයෙන් මසකට වරක් රැස්විය යුතුය. ගණපූරණය සාමාජික සංඛ්‍යාවෙන් 50% වත් සිටිය යුතු වේ. )

**විගණනය**

සමෘද්ධි සමාජ සංවර්ධණ පදනමේ ආදායම් වියදම් ගිණුම් වාර්තා සකස් කර ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට එවිය යුතු අතර මෙම ගිණුම් වාර්ෂිකව විගණනය කළයුතු අතර එය රජයේ විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් වේ.

**ආරවුල් විසඳීම**

සමෘද්ධි සමාජ සංවර්ධන පදනමේ කිසියම් ගැටළුවක් මතු වුවහොත් ඒ පිළිබඳ උපදෙස් දීමට හා තීරණ ගැනීමට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට බලය ඇත. සමෘද්ධි අධිකාරිය දෙන තීරණ පිළිගැනීමටත් උපදෙස් පිළි පැදීමටත් සමාජ සංවර්ධන පදනම බැඳී ඇත.

**ව්‍යවස්ථා සංශෝධනය**

මෙම ව්‍යවස්ථාව සංශෝධනය හා වෙනස් කිරීමේ බලය සමෘද්ධි අධිකාරිය සතු වේ.

**ආර්.පී.බී. තිලකසිරි,**

**අධ්‍යක්ෂ ජනරාල්.**